ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>**My No.** | ඔබේ අංකය<br>உமது இல.<br>**Your No.** | දිනය<br>திகதி<br>**Date** 2016-08-16 |

පැමිණිලිකරු : පි.එම්.ජේ.සි. ගජනායක මයා,
මිනිස්බල සංවර්ධන හා පුහුණු කිරීම් අංශය,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
තෙලවල පාර, රත්මලාන.

වගඋත්තරකරුවන් : 01. සාමාන්‍යාධිකාරි,
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
ගාලු පාර, රත්මලාන.

02. අධ්‍යක්ෂ ජනරාල්,
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

<u>පැමිණිලි අංක : HRC/2056/15</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, වගඋත්තරකාර ආයතනයේ පුරප්පාඩු වු කළමණාකරු (මානව සම්පත්) තනතුරු සඳහා 2015.03.23 දිනැතිව අයදුම්පත් කැඳවා තිබූ අතර එහිදි මූලික සුදුසුකම් ලෙස අදාළ ක්ෂේත්‍රයේ වසර 5 ක MM 1-1 ශ්‍රේණියේ සේවා කාලයක් දක්වා තිබූ බවයි. එම මූලික සුදුසුකම හා සෙසු අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් ද ඇති තමන් ද එම තනතුර සඳහා අයදුම් පත්‍රයක් යොමු කළ බවත් 2015.04.28 දිනැතිව පැවති සම්මුඛ පරීක්ෂණයට තමා ඇතුලුව තවත් නිලධාරීන් හත්දෙනෙකු සහභාගි වු බවත් එයින් වැඩිම පළපුරුද්ද හා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇත්තේ තමා පමණක් බව තමා විශ්වාස කරන බවත් සඳහන් කර ඇත.



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165,කිංසි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011-2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2696470 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2689558, 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

2015.05.22 දින එම පරීක්ෂණයෙන් තෝරා ගත් නිලධාරීන් දෙදෙනෙකුට පත්වීම් ලබා දුන් නමුත් තමා හට MM 1-1 ශ්‍රේණියේ වසර 5 ක සේවා කාලයක් නොමැති බව තමා වෙත දැන ගන්නට ලැබුණු බවත් සඳහන් කර ඇති අතර පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත්තේ සුදුසුකම් රහිත නිලධාරීන්ට 2015.04.28 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයෙන් ලබා දුන් තනතුර අවලංගු කිරීම හා සුදුසුකම් සපුරා ඇති තමා හට එම තනතුර ලබා ගැනීමටද, තමාට උද්ගත වූ අගතිදායක තත්වයන් වෙනුවෙන් සාධාරණ වන්දි මුදලක් ලබා ගැනීමද වේ.

2015.07.20 දිනැති වගඋත්තරකරුගේ වාර්තාව :-

වගඋත්තර පාර්ශවය විසින් සිය ලිඛිත කරුණු ඉදිරිපත් කරමින්, කළමණාකරු (මානව සම්පත්) තනතුර සඳහා 2015.04.28 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද බවත් එම සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුව මෙම පැමිණිලිකරු 3 වන ස්ථානයට ස්ථාන ගත වී ඇති බවත් දන්වා ඇත. එසේම පැවති මුළු පුරප්පාඩු සංඛ්‍යාව 3 ක් වන බවත් අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් අනුව අභ්‍යන්තර උසස්වීම් මගින් නිලධාරීන් දෙදෙනෙකුටද බාහිර අයදුම්කරුවෙකුට ද අවස්ථාව ලබා දීම සඳහා කටයුතු සිදු කර ඇති බව දන්වා ඇත.

පැමිණිල්ලෙන් අභියෝග කර ඇති පත්වීම් ලබා දුන් නිලධාරීන් දෙදෙනා මධ්‍යම කළමනාකරණ මට්ටම නියෝජනය කළ හැකි නිලධාරීන් දෙදෙනෙකු වන බවත් මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ මණ්ඩලයේ ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙල අනුව එම නිලධාරීන් මුලදී නියෝජනය කළ මධ්‍යම කළමණාකරණ මට්ටම කනිෂ්ඨ කළමනාකරණ මට්ටම දක්වා පහත වැටී ඇතත් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30/2006 හා 2006.09.22 දින දරණ චක්‍රලේඛනයේ 6(2) වගන්තිය අනුව කිසියම් නිලධාරියෙකු භුක්ති විඳි වරප්‍රසාද වෙනස් කිරීමක් හෝ සංශෝධනය කිරීමක් සිදු නොවන බව පැහැදිලි කර ඇති අතර ඒ අනුව ගජනායක මහතා විසින් සුදුසුකම් නොමැති නිලධාරීන් පිළිබඳව දක්වා ඇති කරුණු පිළිගත නොහැකි බවත් සඳහන් කර ඇත.

2016.01.19 දිනැති පරීක්ෂණය :-

ඉහත පරීක්ෂණ දිනයේදී වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරමින්, 2012 වර්ෂයේදී වගඋත්තරකාර ආයතනයේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරන ලද බවත් එම අවස්ථාවේදී මධ්‍යම කළමනාකරණ මට්ටමේ සිටි මානව සම්පත් නිලධාරීන් කනිෂ්ඨ කළමනාකරණ මට්ටමට පත් කර ඇති බවත් පසුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඔවුන්ට පමණක් පුද්ගලික වනසේ නැවතත් මධ්‍යම කළමනාකරණ මට්ටමට යටත් කරන ලද බවත් එම පදනම මත මානව සම්පත් කළමනාකරු තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයට පත්වීම් ලද නිලධාරීන් දෙදෙනා කැඳවා ඇති බවත් වගඋත්තර පාර්ශවය විසින් සඳහන් කර ඇත.

එසේම මානව සම්පත් කළමනාකරුවන් බඳවා ගැනීම සම්බන්ධයෙන් වූ බඳවා ගැනීමේ පටිපාටියේ අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ලබා දී ඇති පැහැදිලි කිරීම අනුව මානව සම්පත් කළමණාකරු තනතුරට ඉල්ලුම් කළ හැකි වනුයේ මානව සම්පත් ක්ෂෙත්‍රයේ සේවය කරන අයට පමණක් බවත් නමුත් කළමනාකරණය විසින් පුහුණු කිරීමේ නිලධාරින් අර්ධ වශයෙන් මානව සම්පත් ක්ෂේත්‍රයට ලබා දෙන දායකත්වය සැළකිල්ලට ගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දට ලකුණු ලබා දීමේදී පුහුණු කිරීමේ නිලධාරින්ට ලබා දී ඇත්තේ පූර්ණ කාලීන මානව සම්පත් ක්ෂේත්‍රය නියෝජනය කළ මානව සම්පත් නිලධාරීන් වඩා අඩු ලකුණු සංඛ්‍යාවක් වන බවත් ඒ හේතුවෙන් මෙම පැමිණිලිකරුට ලකුණු අඩුවෙන් ලැබී ඇති බවත් ඒ අනුව ඔහුට සම්මුඛ පරීක්ෂණයේදී 3 වන ස්ථානය ලැබී ඇති බවත් ප්‍රකාශ කර ඇත.

තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ 2012.10.03 දින කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කර අනුමත කර ඇති බවත් ඒ අනුව කළමනාකරණ මානව සම්පත් HM 1-1 තනතුරු 9 ක් අනුමත කර ඇති බවත් MM 1-1 හි 1 වන ශ්‍රේණියේ වසර 5 ක පළපුරුද්දක් සහිත නිලධාරියෙකුට HM 1-1 කළමනාකරු මානව සම්පත් තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති බවත්ය.

2016.06.30 දිනැති පළවන වගඋත්තරකරුගේ වාර්තාව -:

වගඋත්තරකාර ආයතනයේ කළමනාකරු (මානව සම්පත්) තනතුරට අදාළව පැවැති පුරප්පාඩු 3 ක් සම්පූර්ණ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලැබූ බඳවා ගැනීමේ පටිපාටියට අනුව අභ්‍යන්තරින් හා බාහිරෙන් අයදුම්පත් කැඳවන ලද බව සඳහන් කර ඇත.

අයදුම්පත් 2015.04.06 දිනට කැඳවන ලද බවත් එම අයදුම්කරුවන් අතරින් ජේ.එම්.ජේ.සී. ගපනායක මහතා හැර සෙසු අයදුම්කරුවන් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියේ සඳහන් මධ්‍යම කළමනාකරණ මට්ටමට අයත් (MM 1-1) වැටුප් කාණ්ඩයේ පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණ කර නොතිබුණ බව ප්‍රකාශ කර ඇත.

2015.04.28 දින අභ්‍යන්තර බඳවා ගැනීමේ ඒකකයේ පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි අයදුම්කරුවන් අටදෙනා අතරින් ආර්. මැණික්ගමආරච්චි මහතා හා එම්.කේ.ඩී.එම්. ගුණරුවන් මහතා පිළිවෙලින් පලමු හා දෙවන ස්ථානය ලබා ගෙන ඇති බවත් ඒ අනුව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වෙන්කර තිබූ තනතුරු දෙක ප්‍රධානය කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

චක්‍රලේඛ අංක 30 අනුව මණ්ඩලීය කාර්යය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේදී එවකට මධ්‍යම කළමනාකරණ මට්ටම (MM 1-1) ලෙස සැලකූ මණ්ඩල ශ්‍රේණි 7 හා 8 අයත් ඉංජිනේරු නොවන විධායක ශ්‍රේණි වලට අයත් තනතුරු 9 ක් හැර අනෙකුත් සියලු තනතුරු කණිෂ්ඨ කළමනාකරණ මට්ටමට (JM 1-2) යටත් කරන ලද බවත් මානව සම්පත් නිලධාරී තනතුරද එසේ JM 1-2 වැටුප් කාණ්ඩයට යටත් කර තනතුරක් බවත් ප්‍රකාශ කර ඇත. ඒ පිළිබඳ මණ්ඩලයේ වෘත්තීය සමිති වල විරෝධතාවයන් හේතුවෙන් එම වැඩි බලපෑම් සැළකිල්ලට ගෙන පාලන අධිකාරිය විසින් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කිරීමට පෙර මණ්ඩල ශ්‍රේණි 6 හි සිටි විධායක නිලධාරීන් ඔවුනට පමණක් පුද්ගලික වශයෙන් 2011.10.17 දින සිට MM 1-1 වැටුප් කාණ්ඩයට අන්තර්ග්‍රහණය කරන ලද බව දන්වා ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත්තද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොමැති බවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කළද මේ වනතෙක් එකඟතාවය ලබා ගැනීමට නොහැකි වී ඇති බවද දන්වා ඇත.

බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ සඳහන් පරිදි MM 1-1 වැටුප් කාණ්ඩයට අයත් කළමනාකරණ ගණයේ පළමු ශ්‍රේණියක තනතුරද, වසර 5 ක සේවා කාලය ගණනය කිරීමට මෙම නිලධාරීන් මණ්ඩල ශ්‍රේණින් 6 හා 7 අයත් පිරිස් නිලධාරී තනතුරු වල සේවය කළ කාලයද, සැළකිල්ලට ගෙන ඇති බවද එසේ සිදු කර ඇත්තේ චක්‍ර ලේඛ අංක 30 නිකුත් කිරීමට පෙර වැටුප් ක්‍රමයේ බී.සී පෙරේරා වැටුප් කොමිසමේ නිර්දේශයන් සැළකිල්ලට ගෙන බවද දන්වා ඇත.

එම කමිටු නිර්දේශයන් මණ්ඩල ශ්‍රේණි 6 හා 7 මධ්‍යම කළමනාකරණ මට්ටම MM 1-1 යටත් කර තිබීමත් කළමනාකරණ චක්‍රලේඛ අංක 30 ක්‍රියාත්මක කිරීමට පෙර මෙම නිලධාරීන් මණ්ඩල ශ්‍රේණි 6 හා 7 සේවය කර තිබීමත් හේතු කොට ගෙන ඉහත සඳහන් අයදුම්කරුවන් අටදෙනාගෙන් ගජනායක මහතා හැරුණු කොට ඉතිරි හත්දෙනා ඉහත තනතුරට අයදුම් කිරීමේ සුදුසුකම් ඇති සේ සලකා ක්‍රියා කළ බවට දන්වා ඇත.

**නිරීක්ෂණ :-**

2015.03.23 දිනැතිව ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරු තනතුරෙහි පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවා ඇති අභ්‍යන්තර චක්‍රලේඛනයෙහි සඳහන් පරිදි එම තනතුර සඳහා මූලික සුදුසුකම වනුයේ කළමනාකරු කාණ්ඩයේ 1 ශ්‍රේණියේ එනම් MM 1-1 කාණ්ඩයේ වසර 5 ක ක්ෂේත්‍රයට අදාළ සෑහීමකට පත් විය හැකි සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම වේ.

2008.09.22 දිනැති පැමිණිලිකරු අමතා වගඋත්තරකාර ආයතනය මගින් නිකුත් කර ඇති ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ වැටුප් ප්‍රතිශෝධන ලේඛනය අනුව පැමිණිලිකරු MM 1-1 කළමනාකරු ගණය යටතේ වැටුපෙහි පිහිටුවා ඇති බව නිරීක්ෂණය වන අතර ඒ

අනුව පැමිණිලිකරු මානව සම්පත් කළමනාකරු තනතුර සඳහා අවශ්‍ය මූලික සුදුසුකම සපුරා ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන ජේ.එන්.ජේ.සී. ගජනායක මහතා හැර සෙසු සියලුම අයදුම්කරුවන් බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටියේ සඳහන් මධ්‍යම කළමනාකරණ අයත් MM 1-1 වැටුප් කාණ්ඩයේ පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණ කර නොමැති බව 2016.06.30 දිනැති වගඋත්තරකරුගේ වාර්තාවේ සඳහන් එකී අයදුම්කරුවන්ගේ සුදුසුකම් අනුව නිරීක්ෂණය වී ඇත.

මානව සම්පත් කළමනාකරු තනතුරට උසස්වීම් ලබා ඇති නිලධාරීන් දෙදෙනා හට 30 චක්‍රලේඛනය ක්‍රියාත්මක කිරීමට පෙර මණ්ඩල ශ්‍රේණි 6 හි සිටි විධායක නිලධාරීන් ඔවුනට පමණක් පුද්ගලික වන සේ 2011.10.18 දින සිට සිදුකර ඇති මධ්‍යම කළමනාකරණ මට්ටමට (MM 1-1) වැටුප් කාණ්ඩයට අන්තර්ග්‍රහණය කිරීමට වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලැබ තිබුණද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය වේ.

ඉහත සඳහන් සියළුම කරුණු අනුව වගඋත්තරකාර ආයතනයේ මානව සම්පත් කළමනාකරු තනතුරට උසස්වීම් ලබා දී ඇති ආර්. මැණික්ගම ආරච්චි මහතා හා එම්.කේ.ඩී.එම්. ගුණරුවන් මහතා යන අයට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිසි අනුමැතිය මත මධ්‍යම කළමනාකරණ මට්ටමට අයත් වැටුප් කාණ්ඩයේ සිටින බව සලකා කටයුතු කර නොතිබීම මත මානව සම්පත් කළමණනාකරු උසස්වීම සඳහා අවශ්‍ය මූලිකම සුදුසුකම වන MM 1-1 වැටුප් කාණ්ඩයෙහි වසර 5 ක සේවා කාලය සම්පූර්ණ කර තිබීමේ අවශ්‍යතාවය ඉටු වී නොමැති බව නිරීක්ෂණය වේ. කෙසේ නමුත් 30 චක්‍රලේඛනයේ ප්‍රතිව්‍යුහය ගතකරණයද සමග මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන ගජනායක මහතා 2000.09.01 දින සිට 2015.04.06 දින වන විට MM 1-1 කාණ්ඩයේ වසර 14 මාස 07 දින 05 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය වන අතර මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු ඉහත කී තනතුර සඳහා තේරී පත් වූ නිලධාරීන් දෙදෙනාට වඩා සුදුසුකම් සහිත බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඒ අනුව වගඋත්තරකරු විසින් මානව සම්පත් කළමනාකරු තනතුරට උසස්වීම් ලබා දීමේදී මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුට සුදුසුකම තිබියදී එය නොසලකා නිසි සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද නිලධාරීන් දෙදෙනෙකු හට මානව සම්පත් කළමනාකරු තනතුර ලබා දීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත කර ඇති නීතිය ඉදිරියේ සමාන රැකවරණයක් ලැබීමට ඇති මූලික අයිතිවාසිකම වගඋත්තරකරු විසින් පැමිණිලිකරු විෂයෙහිලා උල්ලංඝනය කර ඇති බව මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව 2015.05.22 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුට මානව සම්පත් කළමනාකරු තනතුරට උසස්වීම ලබා දීමට කටයුතු කරන ලෙසට පළමුවැනි වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2016.09.19 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka